**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මතය**

**-------**

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ වයඹ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, වයඹ විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) විශ්වවිශ්වවිද්‍යාල ප්‍රතිපාදනකොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | | |
| (i) XXVI පරිච්ඡේදයේ 3.1 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල පිටපත් 2022 පෙබරවාරි මාසය අවසන්වීමට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) XXVII පරිච්ඡේදයේ 3. 1 හා 3.2 ඡේදය | රාජ්‍ය ලාංඡනය, විශ්වවිද්‍යාලයේ නම හා ලිපිනය සෑම මෝටර් රථයකම පින්තාරු කළ යුතු වුවද, විශ්වවිද්‍යාලය සතු වාහන 17 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| IX වෙනි පරිච්ඡේදයේ 2. 2ඡේදය | රජයේ සේවයේ දැනුම භාවිතා කරමින් කාර්යාල | මේ සම්බන්ධයෙන් කළමනාකරණ | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | වේලාව තුළදීම කරන කාර්යාලීය නොවන වැඩ සඳහා ලැබෙන ගාස්තුවෙන් සියයට 10 ක් ඒකාබද්ධ අරමුදලට බැරකර යුතු වුවද, මාකදුර පරිශ්‍රයේ බාහිර පාඨමාලාවන්ට අදාළ දීමනාවලින් රාජ්‍යභාගය අයකර නොතිබුණි. | තීරණයක් ගැනීමට කටයුතු කරන බව. | කළ යුතුවේ. |
| (ඇ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක PED/RED/01/04/2014/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 වන ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛ විධිවිධානවලට අනුගත වන ලෙස පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ඒ අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 1.6 ආයෝජන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 06 දෙනෙකු වැඩිදුර අධ්‍යාපනය සඳහා විදේශගතවීමේ ගිවිසුම් බැදුම්කර කඩකිරීම නිසා අයවිය යුතු රු.2,172,842 ක් 2008 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2020 හා 2021 වර්ෂයන්වලදී අයකර තිබුණු රු.17,520,686 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය නොකර ජංගම ගිණුමක රඳවාගෙන තිබුණි. | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන ආයෝජනය කරන බව. | ගිවිසුම් බැදුම්කර කඩකිරීම නිසා අයවිය යුතු මුදල් අයකර ගැනීමට හා ජංගම ගිණුමේ මුදල් රඳවා නොගෙන විධිමත් ලෙස ස්ථාවර තැන්පත් වල ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.53,983,044 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.68,492,160 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,509,116 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.82,500,000 කින් වැඩිවීම හා ප්‍රාග්ධන වියදම් රු.12,384,548 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රයේ නැනෝවිද්‍යා තාක්ෂණවේද දෙපාර්තමේන්තුව ව්‍යාප්ත කිරීමේ කර්මාන්තය සඳහා භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා රු.206,847 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලැබීමෙන් පසු නැනෝවිද්‍යා තාක්ෂණවේද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කර්මාන්තය අවශ්‍ය නොවන බව තීරණය කර තිබීම හේතුවෙන් පුවත්පත් දැන්වීම් පළකිරීමේ වියදම නිෂ්කාර්ය වියදමක්වී තිබුණි. | ප්‍රසම්පාදන කමිටුව වෙත මෙය ඉදිරිපත් කර එම කමිටු තීරණය අනුව කටයුතු කරන බව. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු අතර සිදුවී ඇති අලාභයට වගකිව යුතු පාර්ශවයන් වෙතොත් හඳුනාගෙන අයහාර කළ යුතුවේ. |
| (ආ) | වත්කම් ප්‍රත්‍යාගණනයකදී එක් එක් කාණ්ඩයට අයත් සියළු වත්කම් එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, විශ්වවිද්‍යාලය විසින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත නිවැරදි වත්කම් කාණ්ඩ හා සියළු ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාලයට අයත් වාහන හා විද්‍යාගාර උපකරණ හැර අනෙකුත් වත්කම් කාණ්ඩවල වර්තමාන අගයන් තක්සේරු කර නොතිබුණි. එසේම වාහන හා විද්‍යාගාර උපකරණ පිළිවෙලින් රු.59,797,000 කට හා රු.250,679,200 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු නමුත් එම ප්‍රත්‍යාගණන අගයන් ගිණුම්ගතකරද නොතිබුණි. | නැවත ස්ථාවර වත්කම් තක්සේරුව සිදුකර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් නිවැරදිව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර, පිරිවැය රු.778,570,309 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් | ඉදිරියේදී නිවැරදි කරන බව. | ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර |

| | | |
|---|---|---|
| ක්ෂය කර ඇතත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. | | ගිණුම්ගත කළ යුතුවේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016/2017, 2017/2018 හා 2018/ 2019 අධ්‍යයන වර්ෂ සඳහා බඳවා ගෙන තිබුණු සිසුන් විශ්වවිද්‍යාලය හැර යාමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 12 ක් 05 ක් හා 3.59 ක් විය. ව්‍යවහාරික විද්‍යාපීඨය සහ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය සඳහා බඳවා ගෙන තිබුණු සිසුන්ගේ හැරයාමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන තිබීම ඊට හේතුවී තිබුණි. | වැඩසටහන් පවත්වා උපදේශකවරුන් මගින් විශ්වවිද්‍යාලය හැරයාම අවම කර ඇති බව. | තවදුරටත් හේතු පරීක්ෂා කර සිසුන් හැරයාම් අවම කරගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අධ්‍යයන අංශවල සැලසුම් පමණක් ඇතුළත් කර තිබුණු අතර අනධ්‍යයන අංශවල සැලසුම් ඇතුළත් කර නොතිබුණි. තවද, එක් එක් කාර්යයන් සඳහා අයවැය ප්‍රතිපාදනය ඇතුළත් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකළ යුතුව තිබුණු කාර්යයන් 13 ක් ආරම්භ කර හෝ නොතිබුණි. | 2022 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම ඒ අනුව පිළියෙල කරන බව හා සැලසුම් කළ කාර්යයන් 13 කොවිඩ් වසංගතය හේතුවෙන් ඉටුකිරීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්ම සියලු අංශවලට අදාළ වන ලෙස පිළියෙල කළ යුතු අතර සැලසුම් කළ පරිදි අදාළ කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| Improving Relevant & Quality of Under Graduate Education ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවෙන් විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු රු.2,003,150 ක් උපයෝජනය නොකර 2014 වර්ෂයේ සිට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | ඉදිරියේදී අදාළ ව්‍යාපෘතිය සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බව. | අරමුදල් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත් වටිනාකම රු.514,303,211 ක් වූ ඉදිකිරීම් කර්මාන්ත 15 ක් අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් නියමිත කාලය තුළදී නිම කර භාරදී නොතිබුණි. නමුත් විශ්වවිද්‍යාලය විසින් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. | කාලගුණ තත්ත්වයන් හා විදුලි ප්‍රමාද නිසා අදාළ අනුමැතිය මත දින දීර්ඝ කර ඇත ි බව. | ගිවිසුම් ගත කොන්ත්‍රාත් කාලය තුළදී වැඩ අවසන් කර ගැනීමට කටයුතු කරමින් අනාගත මිල විචලනයන් නිසා සිදුවිය හැකි පාඩු අවම කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | කොන්ත්‍රාත් වටිනාකම රු.176,000,000 ක්වූ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ III අදියරය යටතේ ඉදිකර තිබුණු ගොඩනැගිල්ල 2019 මාර්තු 01 දින විශ්වවිද්‍යාලය වෙත භාරදී තිබුණු නමුත් පසුව හඳුනාගෙන තිබුණු අඩුපාඩු නිවැරදි කරන ලෙස 2019 දෙසැම්බර් 02 දින එම පීඨයේ ප්‍රධානියා හා විශ්වවිද්‍යාලයේ ඉංජිනේරුවරයා විසින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණි. නමුත් මෙම වාර්තාවේ දිනය වන විටත් ඒවා නිවැරදි කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට යන වියදම් අවසන් බිල්පතින් අඩුකිරීමට තීරණය කර ඇති බව. | කොන්ත්‍රාත් ගිවිසුම් කාලය තුළදී අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට හෝ එම අඩුපාඩු නිවැරදි කර ගැනීමෙන් පසුව ඒ සඳහා වැයවන සත්‍ය වියදම අවසන් බිල්පතින් අඩුකිරීමට කටයුතු කළ යුතුවේ. |